**මන්මුනේ ප්‍රාදේශීය සභාව - 2022**

**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

මන්මුනේ ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මන්මුනේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම )

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීම , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා පළාත් පාලන සංවර්ධන සහාය ව්‍යාපෘතිය (LDSP) යටතේ වූ මූල්‍ය ප්‍රතිපාදනවලින් රු. මිලියන 4.151ක ගිවිසුම්ගත වටිනාකමකින් ඉදිකර සභාවට භාරදුන් කිරාන්කුලම් ග්‍රාමීය කඩකාමර සංකීර්ණයේ වටිනාකම ගිණුම්ගතකර නොතිබුණි. | මෙහි වටිනාකම 2023 වර්ෂයේ ගිණුම් වාර්තාවල හෙළිදරව් කරන බව. | වත්කම්වල වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂය අවසානයේ ගබඩාවේ රු.60,551ක්වූ ගබඩා තොග පැවැති අතර එම තොගය මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස දක්වා නොතිබුණි. | ගබඩා තොගයේ වටිනාකම ඉදිරිපත් නොකිරීම නිසා වත්කම් ලෙස හෙළිදරව් කර නොතිබුණු බව. | -එම- |
| (ඇ) | සභාව විසින් පරිපාලනය කරනු ලබන පුස්තකාල සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පරිත්‍යාග ලෙස ලැබුණු පොත් 106ක වටිනාකම රු.41,190ක් මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස දක්වා නොතිබුණි. | ඉදිරියේදී මෙම පොත්වල වටිනාකම ගිණුම්ගත කරන බව. | පරිත්‍යාග ලද පොත් මූල්‍ය ප්‍රකාශනවල වත්කම් ලෙස දැක්විය යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| **ඉදිරිපත් නොකළ විගණන සාක්ෂි** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.69,475,965 ක් වටිනා ගිණුම් ශේෂ 07 ක් හිමිකම් ඔප්පු, ස්ථාවර වත්කම් ලේඛනය, උප ලේඛන සහ ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කළ නොහැකි විය. | තාවකාලික තක්සේරු කිරීම් ඉදිරියේදී වත්කම් වටිනාකම ගිණුම්ගත කිරීමටත් හිමිකම් ඔප්පු නොමැති ඉඩම්වලට ඔප්පු ලබාගැනීමටත් කටයුතු කරනු ලැබේ. | වත්කම්වලට අදාල ලිපිලේඛන රැස්කර ලෙජරයේ ඇතුළත් කිරීමට පියවර ගතයුතු වේ. |

## 1.7 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(1) උපවගන්තිය හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පාලන) රීති 59 | ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ පිහිටි ව්‍යාපාර පිළිබඳ සමීක්ෂණයක් සිදුකර ඒ අනුව බලපත්‍ර ගාස්තු බිල්කර නොතිබුණි. | 2023 වර්ෂයේ සිට ඔබගේ උපදෙස් ප්‍රකාරව යාවත්කාලීන කරමින් පවතින බව. | වර්ෂයට නියමිත වෙළෙඳ බලපත්‍ර ගාස්තු සම්පූර්ණයෙන් අයකිරීමට පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.18,381,968ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්ම වූ වියදම රු.18,837,813ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම් | බිල්කළ ආදායම | රැස්කළ ආදාය | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදාය | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| -------- | ----------- | -------- | -------- | ---------- | ----------- | -------- | -------- | ---------- |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 2,210,000 | 3,242,960 | 3,280,635 | 525,197 | 2,100,000 | 5,919,359 | 3,544,211 | 562,872 |
| කුලී | 9,644,600 | 9,378,800 | 8.083,000 | 1,861.447 | 6,573,760 | 5,534,947 | 4,267,825 | 565,647 |
| බලපත්‍ර ගාස්තු | 1,895,000 | 1,507,250 | 1,554.690 | -- | -- | 1,789,585 | 1,789,585 | 47,440 |
| වෙනත් ආදායම් | 28,020,000 | 48,057,170 | 48,355,585 | 3,430,939 | 19,425,317 | 48,591,937 | 48,660,266 | 3,729,355 |
| එකතුව | 41,769,600 | 62,186,180 | 61,273.910 | 5,817,583 | 28,099,077 | 61,835,828 | 58,261,887 | 4,905,314 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීම්වල කාර්යසාධනය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) කුලී**<br>සමාලෝචිත වර්ෂය අවසාන දිනට හිඟහිටිව තිබූ කුලී හා බදුකුලී ආදායම් පිළිවෙලින් රු.761,197ක් සහ රු.1,100,250 අයකර නොතිබුණි. එසේම, මෙම හිඟහිටි සඳහා කාලවිශ්ලේෂණයද විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | හිඟහිටි අයකර ගැනීමට පියවර ගෙන ඇත. එසේම, කාලවිශ්ලේෂණය මේ වන විට සකස් කර ඇති බව. | කුලී හා බදුකුලී අයකර ගැනීමට පියවර ගත යුතුය. |
| **(ආ) මුද්දර ගාස්තු**<br>සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ අනෙකුත් බලධාරීන්ගෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු රු.8,126,950ක් විය. | මුද්දර ගාස්තු අයකර ගැනීමට පියවර ගෙන ඇත. | මුද්දර ගාස්තු ගෙන්වා ගැනීමට පියවර ගතයුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **ගොඩනැගිලි අනුමැතිය** | | |
| **(i)** | 1992 සැප්තැම්බර් 30 දිනැති සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් ප්‍රකාශයට පත්කළ අංක 1769 දරන පොදු චක්‍රලේඛය ප්‍රකාරව, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයකුට ගොඩනැගිල්ලක සැලැසුම් නිර්මාණය කළ හැක්කේ තනි මහලේ නිවාස සඳහා පමණක් වුවත් සමාලෝචිත වර්ෂය තුළ මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් අඳින ලද දෙමහල් ගොඩනැගිලි 03 ක සැලැසුම් සභාව විසින් අනුමත කර තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව, නියමිත උපදෙස් ලබාදී ඒ සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | චක්‍රලේඛය ප්‍රකාරව ගෙවීම් කිරිමට කටයුතු කළ යුතුය. |
| **(ii)** | ගොඩනැගිලි ඉදිකිරිමේදි එහි වාතාශ්‍රය සහිතව පවතීද යන්න තහවුරු කර ගැනීම සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගෙන් වාර්තාවක් ලබාගත යුතු වුවද සමාලෝචිත වර්ෂයේ ගොඩනැගිලි අයදුම් පත් 16ක් සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ වාර්තා ලබාගැනීමකින් තොරව අනුමත කර තිබුණි. | ඉදිරියේදී කාලප්‍රමාදයක් සිදුනොවී ගොඩනැගිලි අයදුම් පත් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ නිර්දේශ සඳහා යවන බව. | ගොඩනැගිලි අයදුම් පත් මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයාගේ වාර්තා ලබා ගැනීමට පියවර ගත යුතුය. |
| **(ආ)** | සභාවට අයත් ඉඩම් 62ක වටිනාකම තකේස්රු කර ගිණුම්වල වත්කම් ලෙස දක්වා නොතිබුණි. | ඉඩම්වල වටිනාකම මේ දක්වා තක්සේරු නොකිරිම හේතුවෙන් ගිණුම්වල වත්කම්වල වටිනාකම වෙනමම දක්වා නොතිබුණි. | ඉඩම් වත්කමක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වේ. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් පරිහරණය කරනු ලබන වාහන 09, ට්‍රැක්ටර් පෙට්ටි 02ක් සහ වතුර බවුසරයක් සභාවේ නමට මාරුකිරීමට පියවර ගෙන නොතිබුණි. | සභාව විසින් පරිහරණය කරනු ලබන වාහන පවරා ගැනීමට කටයුතු කරන බව. | වාහන පවරා ගැනීමට පියවර ගත යුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ 4.2.1 මාර්ගෝපදේශය සහ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2006 මාර්තු 26 දිනැති අංක 128 දරන චක්‍රලේඛය ප්‍රකාරව, සැපයුම් ක්‍රියාකාරකම් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීමට උචිත ක්‍රියාමාර්ග ගන්නා බව. | සැපයුම් ක්‍රියාකාරකම් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරිමට පියවර ගත යුතුය. |

3.4 **මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **සේවක පුරප්පාඩු සහ අතිරික්ත** | | |
| කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කළ කාර්යමණ්ඩල ලැයිස්තු ප්‍රකාරව, සභාවේ පැවැති තනතුරු 08ක් සඳහා පුරප්පාඩු 11ක් සහ අතිරික්තව සේවකයින් 06ක් පැවැතුණි. | මාසිකව කාර්ය මණ්ඩල විස්තර වාර්තාව පළාත් පාලන කාර්යාලය සහ සහකාර පළාත්පාලන කාර්යාලයට යවන බව. | තනතුරු පුරප්පාඩු සහ අතිරික්ත සේවකයින් පිළිබඳව සුදුසු ක්‍රියාමර්ග ගත යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>සභාවේ අදහස් දැක්වීම</u> | <u>නිර්දේශය</u> |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2)උප වගන්තිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදි වාර්ෂික කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කරන බව. | වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කළ යුතුය. |

**4.2 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම**

| <u>විගණන නිරීක්ෂණය</u> | <u>සභාවේ අදහස් දැක්වීම</u> | <u>නිර්දේශය</u> |
|---|---|---|
| වාර්ෂික අයවැය ප්‍රකාරව, සභාව විසින් ක්‍රියාත්මක කළයුතු ක්‍රියාකාරකම් 31ක් සඳහා ක්‍රියාකාරි සැලැස්මක් සකස් කර නොතිබුණි. | ඔබගේ උපදෙස් පරිදි ඉදිරියේදී වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කරන බව. | අයවැය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම සකස් කළ යුතුය. |

4.3 පාරිසරික ගැටළු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1988 අංක 56 දරන පනතින් හා 2000 අංක 53 දරන පනතින්, 2008 අංක 01 දරන පනතින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ 2022 ජනවාරි 27 දිනැති අංක 2264/18 දරන විශේෂ ගැසට් පත්‍රයේ "ආ" වගන්තිය ප්‍රකාරව කීච්චාන් පල්ලමේ පිහිටි ගව ඝාතකාගාර ස්ථානයට පරිසර බලපත්‍ර සභාව විසින් ලබාගෙන නොතිබුණි. | ඉදිරියේදී මේ පිළිබඳව අවධානය යොමු කරන බව. | පරිසර බලපත්‍ර ලබාගැනීමට පියවර ගතයුතු වේ. |
| (ආ) | ආරයම්පදි පොදු වෙළෙඳපොලේ දෛනික වෙළෙඳාමේ නියුක්ත කාන්තා හා පිරිමි ව්‍යාපාරිකයින්ට වැසිකිළි 06ක් ඉදිකර තිබූ නමුත් 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 85(ඇ) වගන්තිය ප්‍රකාරව වැසිකිළි නඩත්තු කිරීම සභාව විසින් ක්‍රියාත්මක කර නොතිබුණි. මේ හේතුවෙන් වැසිකිළි 04ක් භාවිතා කළනොහැකි තත්ත්වයේ පැවැතුණි. | පොදු වැසිකිළි පරිහරණයට සුදුසු අයුරින් වෙනස් කිරීමට ක්‍රියාමාර්ග ගෙන 75% ක කාර්යයන් සම්පූර්ණ කර ඇති බව. | වැසිකිළි නඩත්තු කිරීමට පියවර ගතයුතු වේ. |